- රකිමු පර පණ (20 පාඩම)

දුවේ, පුතේ මේ පාඩම අපි වැඩිහිටියෙකුගේ උදව් ඇතිව කියවමු නේද ?

01. පාඩමේ කවිය තාලයට ගායනා කරමු.

බුදු බණ අසමින් සිත සතපායේ

කුරු පණ කම් ඇර පිය ඒ පායේ

පර පණ නැසුවොත් කවර උපායේ

අපමණ දුක දෙයි සතර අපායේ

(ලෝ වඩ සඟරාව - වීදාගම මෛත්‍රේය නාහිමි)

02. අපි කවිය ලස්සන අත් අකුරින් බුද්ධාගම අභ්‍යාස පොතේ ලියමු.

03. කවියේ තේරුම වැඩිහිටියන්ගෙන් අසා දැනගනිමු.

වාචික පිළිතුරු දෙන්න.

01. කවියෙන් කියවෙන පරිදි බුදු බණ ඇතුලත් පොතේ නම කියන්න

02. එම පොත ලියා ඇති කතුවරයාගේ නම කියන්න

03. මෙම කවියේ සඳහන් පරිදි කිරීමට එපා කියන්නේ කුමක්ද ?

04. ලෝ වැඩ සඟරාව ඔබේ වූටි පුස්තකාලයට එකතු කර ගන්න.

දුවට පුතාට තෙරුවන් සරණයි !